ටීකාව

ව. කැදැරම්බන්ධු

'ගැහැනුන් ද පිරිමින් ද උපන් ඇඳුම්න් නාන හැටි දුටුහු ද' යන ව්‍යාකරණ අනුකූල වාක්‍යය, කෙටි කතාවක සංවාදයක දී 'අප ලියන්නේ' ගැහැනුයි පිරිමියි උපං ඇඳුමෙං නාන හැටි දැක්කා ද?' යනුවෙන් විය හැකි ය. දෙවන වැකියේ 'ගැහැනුයි පිරිමියි' උක්ත රූප ගෙන ඇත. දොඩන බසේ අනුක්ත රූප යෙදෙන්නේ කලාතුරකිනි. එහෙත්, ඒ දෙපළ 'ගැහැනුන් ද පිරිමින් ද' යනුවෙන් හෝ 'ගැහැනුනුයි පිරිමිනුයි' යනුවෙන් හෝ විය යුතු යැයි කීමේ හේරුමක් නැත.

'දැන් දං හුඟාක් ලේඛකයො දොඩන බාසාවෙං ලියන්න වැඩි කැමැත්තක් දක්වන බව පේනව. ඒක හින්ද දොඩන බාසාවං ලියල තියන ලිපිවල උක්තානුක්ත සම්බන්ධය වත් උක්තාක්‍යාත සම්බන්ධ-යවත් ඊකාරං විමසෙන්නෑ. ඒකං විමසෙනං න/ණ, ල/ළ, ශ/ෂ දොස් පමණයි. අල්ප ප්‍රාණ මහා ප්‍රාණ ඒ තිබුණොත් (පරිඝණක) ඒතරක් ඒ ගැනත් විමසෙනව'

මේ කැඩියේ 'ලේඛකයේන්, භාෂාවෙන් සම්බන්ධය, උක්තාක්‍යාත සම්බන්ධය' යන හිඩැරදි වචන ලියා නැතෙත් ඒ නිසා ය.

අලි කෙළි, පන්හිඳැයි පින්සලයි, සැබෑ මැයි දිනය තිබෙන්නේ ධනපති රටවලයි, අමරදේවයන් ගායකයෙක් උණ හැටි, බන්දුන් සමුළුව හරහා... එසේ දොඩන බසින් ලියවුණු සාර්ථක ලියවිලිය. දොඩන බසින් ඇරඹෙන ඇතැම් ලියවිලි අවසන් වන විට ලියන බසට මාරු වන අවස්ථා හිතර දක්නට ලැබේ. අලි කෙළින්, අමරදේවයන් ගායකයෙක් උණ හැටින් ඉතා උසස් ලියවිලි දෙකකි.

3 වන පිටුව :
කළාපය - ලා,
හිශ්ශබ්ද - ශ්ශ,
නෙලා - ළා,
යෙදුනේ - ණේ,
පල වන -ළ, උණ නම් හිඩැරදි ය. පැහැදිලි පැහැදිලි දෙ විදියට ම ලියැවී ඇති දෙ - විදිය ම හිඩැරදි ලෙස සැලකෙතත් එක ම ලිපියේ දෙ විදියකට ලිවීම හැඩ නැත.

'වීඳ ගමු' සදොස් ය. 'ගන්' ධාතුවෙන් 'ගනුමු - ගන්මු - ගමිමු - ගනිමු' වැනි රූපයක් මිස 'ගමු' යන රූපය සදා ගත නො හැක. 'ගමු' සදා ගත හැක්කේ 'ග' ධාතුවක් ඇතකොහිනි. 'ක' ධාතුව මෙහි.

4 වන පිටුව : (ප්‍රශ්න ආවලිය) වැලක් - ළ, ළබන - ල,
හිතුන ද - ණ, උණා නම් හිඩැරදි ය.

6 වන පිටුව : ඉක්මණට - න, පුන්කලස - ළ, උණා නම් හිඩැරදිය.

7 වන පිටුව : රා මන්ඩ - ණ්, දියණිය සදොස් වහරකි. එහෙත් දැන් බොහෝ දෙනා එය ලියති. ආණ, අණි, අණු, ප්‍රතා එක් වූ පද බහුවචනම විය යුතුය. සිටාණා, මණණිය, පුතාණුවා සදොස් ය. වීයලි - ළි, ගුලි - ළි, ඇතවුම - ණ, උණා නම් හිඩැරදි ය.

9 වන පිටුව : ප්‍රශ්න - න, සියළු - ලු, පල කරනු - ළ

10 වන පිටුව : කොම්පැණි, පැණි නිසා ලියැවී ඇති සේ ය. අන්කල්, ඇණ්ටි යන තැන් වර්ගා ක්ෂරය අනුව අඩ්කල්, ඇණ්ටි විය යුතු නිසා, 'ඩ්', ඤ්, ණ්, න්, මි යන නාසික්‍ය පහට ම පොදු 'ං' අනුස්වරය යොදා 'අංකල්', ඇංටි' යනුවෙන් ලිවීම වඩාත් උචිත ය. න/ණ, ල/ළ ඡේදය සලන අය මෙන්ඩ්ස්, ලන්ඩන්, ලින්ටන්, ඇන්ටන්, උන්ට, මුන්ට ලිවීම හොඳ නැත. එහෙත් අද එය නැත තැකීමක් නො කෙරේ.

"බහුතරය මාධ්‍යවේදීන් ය" යන්න "බහුතරය මාධ්‍යවේදීහු ය" විය යුතුය.

"ඔබ මට දෙවියන් දුන් දරුවන් ය" යන්න - "ඔබ මට දෙවියන් දුන් දරුවෝ ය" විය යුතුය.

11 වන පිටුව : දොඩන බසේ ලියවිල්ලකට කෘත්‍රිම, බහුශ්‍රැත වැනි වචන කූර්තිම, බහුස්රුත යන විදියට ලිවීම වඩාත් ගැළපේ. මුළපුරුන ල, ලුලා නැති වචන - ළ, යාලුවෝ - ළු යතුරු දොස් විය හැකිය.

13 වන පිටුව : 'අදු වෙලා තියෙන්නෙ... මොකක් හරි මිනිහෙක්... තරගයක් අදු තියෙන්නේ' වැකිය ගැළපීමේ දොසක් තිබේ. 'රටවල්', 'ගෙවල්වල' නිතර වරදින තැන් ය. රට වල් වල, රටවල් විය යුතුය.

14 වන පිටුව : කුරුළු - ලු, සියළු - ලු, බරපතල - ළ, ප්‍රශ්ණය - න, නිස්ශබ්ද - ශ්ශ, ප්‍රදර්ශණය - න, පොලිමේ - ළි, යතුරු දොස්ද?

16 වන පිටුව : බැළුවිහ - බැලූ හ, ලියැවුන - ණ, කළින් - ලි, පෙණුනි - නුණි උණා නම් හොඳැත්.

19 වන පිටුව : ලඟ - ළ, ඇතුන ද - ණ:, හෙලන්නෙපා - ළ, කඳුලක් - ළ, යලි - ළි, සිඳුනු - ණු, ගිණි - ගි, (අකාපළ) කල - ළ, ළඳේ - ල, (ළඳ ලඳක් යනු ප්‍රාබාල කාන්තාවක් යන අරුත දේ) තුරුළු - ලු, සියළු - ලු, එකතු කල - ළ, ඔබ මට දෙවියන් දුන් දරුවන් ය. - දරුවෝ ය, කර ගමි - ගනිමි, දෝණිට - දියණියන්ට 3.7 පිටු බලන්න.

21 වන පිටුව : සමරණායක - නා, යතුරු දොසකැත් සිතමි. අපේ බසේ පදයක මුලට ඇති 'අ' ඊවාසවත් අගට ඇති 'අ' යන්න සංවෘතත් කියවීම පිළිගත් රීතියක්. බලය, මලය, වහල යන පදවල අග අකුර සංවෘත ව කියවීය යුතුය. බලයා - ය, මලයා - ය, වහලා - ල යන තැන්වල ඊර්ෂ්‍ය හුස්වයක් ලෙස දොඩන බසේ කියවේ. එය ලියූ විට ද අත ස්වරය සංවෘත ව හැඩැයේවි. එහෙත්? එබඳු පදු 'ආ' ස්වරය සහිත ව ම ලිවීම මැනවැයැ උගත්තු කියති. මගේ ලියවිලිවල මා ඒ තැන්වල විසර්ගය : ලියමි. 'සීය : බල්ල, තාවල, ගිහිල්ල' ආදී වශයෙනි.

22/23 වන පිටු : ආකර්ෂණීය - ෂ, දර්ශණය - න, අඩ පන - ණ, පසරැන්තන් - ණියන්, උණ ගම් හිඩැරදිය. රැලි, ලොලි, කොම්පැයනි, සයිකලය, බෝල වැනි ඉංගිරිසි වචන ලිවීමේ දී දන්නත් න ලිවීම වඩාත් උචිත යැයි සිතමි.

24 වන පිටුව : ගැටළු - ලු, පෙනින - හිණ, බරපතල - ළ, ගිණි කෙළි - නි යතුරු දොස් විය හැකිය. 'බහුතරය මාධ්‍යවේදීන් ය' යන්න 'බහුතරය මාධ්‍යවේදීහු ය' විය යුතුය.

25 වන පිටුව : හැලෙන - ළෙ, කුරුළු - ලු
අත්‍යාවශ්‍ය - අත්‍යවශ්‍ය, තුරුලතා - තුරුලිය/ වෘක්ෂලතා උණා නම් වඩාත් හිඩැරදිය.

26 වන පිටුව : මුලු - ළ, සඳකා - ල 28 වන පිටුව : සැළෑ ය, සැළසුම් - ළ, පැලෑවි - ළෑ, සැළකිලිමත් - ල යතුරු දොස් විය හැකි ය.

මෙහි බොහෝ සදොස් තැන් යතුරු දොස් විය හැකිය. දුහුනන් සඳහා ඒවා දක්වන ලද බව සැලකුව මැනවි.

FLU එන්නත වසරක් පාසා අලුත් කළ යුත්තේ ඇයි ?

ආචාර්ය විජ්‍යානි මනතුංග

Flu යන කෙටි වචනයෙන් හැඳින්වෙන Influenza රෝගය, ඉතාලි භාෂාවේ 'influence' ලෙසත්, ලතින් භාෂාවේ 'influentl' ලෙසත් සඳහන්වෙන අතර, මේ වචන දෙකේම අර්ථයෙන් දැක්වෙන්නේ ස්වර්ගයේ සිට පැමිණෙන හරක බලපෑමක් රෝගයට හේතුව බවයි. වචනයේ අර්ථය කෙරෙහි වන විශ්වාසය කෙසේ වෙතත්, ගත ඒ ගිය කල වර්ෂය තුලදී 'flu' වසන්තයන් හිඟා ලෝකයේ මියගොස් ඇති සංඛ්‍යාව මිලියන් ගණනකි. 1918-19 දී 'Spanish flu' නිසා මිලියන 21 ක්ද, 1957-58 දී 'Asian flu' නිසා මිලියනයක්ද, 1968-69 දී 'Hongkong flu' නිසා මිලියනයක්ද, මරණ වාර්තා වී තිබේ. ලෝක ජනගහනය සහමුලින්ම නතු කරගන්නා වසංගත තත්ව වලදී මෙසේ මිලියන ගණනින් මරණ වාර්තා වුවද, වසරක් පාසා සැලකියයුතු ප්‍රතිශතයක් මෙම රෝගයට ගොදුරුවේ.

ස්වසන පද්ධතිය හා සම්බන්ධ රෝගයක් වන flu, සාමාන්‍ය සෙම්ප්‍රතිශනාවට (Common Cold) වඩා තරමක් අන්තපත් රෝගී තත්වයකි. සෙම්ප්‍රතිශනාවකදී දැනෙනවාට වඩා දරුණු ලෙස ඇතිවන ඇඟ පත වේදනාව, ඇඟේ අප්‍රාණික බව, උණ, හිසේ කැක්කුම, කැරකිල්ල, ආසයෙන් දුරලීම, කෑම අරුචිය, දැඩි හෙලෙව්වුව, වමනය හා කැස්ස, flu, රෝගයේ මූලික රෝග ලක්ෂණ වශයෙන් හැඳින්විය හැකියි.

මෙම රෝගයේ ඇති අයහපත් තත්වය නම් බරපතලු ද්විතීය ආසාදන වලට මේ නිසා ඉඩකඩ සැලසීමයි. ද්විතීය ආසාදන ලෙසට හඳුන්වන්නේ, රෝගී වීම නිසා දුර්වල බවට පත්වා ඇති පටකය මත වෙගත් රෝග කාරකයන් පහසුවෙන් ක්‍රියාකාර තවතවත් බරපතලු රෝගී තත්වයන් රෝගිය තුල ඇති කර ලීමයි. හිවීමෝනියාව වැනි ද්විතීය ආසාදන පමණක් නොව, තදබල ලෙස වෛද්‍ය ප්‍රතිකාර ලබාදීය යුතු හදවත් දුර්වලතා, ඇස්මා, හෝ කණේ ඇතිවන රෝගී තත්වත් මීට උදාහරණ ලෙස දැක්විය හැකිය. වයස් ගත පුද්ගලයෙකුට නම් වයස අවුරුදු 65 ට වඩා වැඩි! මෙය හදවතේ හෝ පෙනහලු වල ඇතිවන මරණය දක්වා බරපතලු විය හැකි අවදානම් සහගත ද්විතීය ආසාදනයන් වලට මුල්වීමට බොහෝ ඉඩ අතර.

Flu හා සම්බන්ධ වූ හිවීමෝනියාව හිඟා ඕස්ට්‍රේලියාවේ 2002 වසරේදී මරණ 3084 ක් වාර්තාගත වී ඇති අතර, එම සංඛ්‍යාව රටේ පිරිමි මරණ ප්‍රමාණයෙන් 2.0 % ක්ද, ගැහැණු මරණ ප්‍රමාණයෙන් 2.7 % ක්ද හියෝජනය කරයි. 1988 වසරේ ඕස්ට්‍රේලියාවේ සිදුවී ඇති මරණ ප්‍රමාණයෙන් 3.6 % ක් මරණ සඳහා හේතු වශයෙන් දැක්වෙන්නේද flu රෝගයේ ද්විතීය ආසාදන හිඟා ඇතිවුණු හිවීමෝනියා රෝගී තත්වයයි.

අපට හුරුපුරුදු සාමාන්‍ය සෙම්ප්‍රතිශනාවක් දීන තුන-හතරකින් පමණ හොඳ අතර හැරෙන්නේ ශරීරය තුළ සවිභාවිකව ඇති වන ප්‍රතිශක්තිකරණයේ හේතුවෙනි. මූලික වශයෙන් මේ හේතුව නිසාම සෙම්ප්‍රතිශනාව වෙනුවෙන් වෛද්‍යවරයෙක් බෙහෙතක් නිකුත් කිරීමට මැලිකමක් දක්වයි. අපේ වැඩිහිටියන් සෙම්ප්‍රතිශනාවකදී හැමෙන් වැලකී, කොත්තමල්ලි ටිකක් තම්බා බී විවේකයෙන් ඉන්න යැයි අවවාද දෙන්නේත් අවබෝධයෙන් හෝ අනවබෝධයෙන් මේ ස්වභාවික ප්‍රතිශක්තිකරණයේ ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරමේ බලාපොරොත්තුවෙනි.

රෝගයකට ගොදුරු හොවී සිටීමට අප කා තුළත් ඇත්තේ කැමත්තකි. ඒ කැමැත්ත වෙනුවෙන් ක්‍රියාත්මක විය හැකි ආකාර දෙකක් ඇත. එක් ආකාරයක් නම්, රෝගයට වරක් ගොදුරු වී නිසා ශරීරය තුල සවිභාවිකව ඇති වන ප්‍රතිශක්තිකරණය මගින් විෂඝ්‍ර අවස්ථාවේ ඒ ආකාරයේම වන රෝග කාරකයකට විරුද්ධව සටන් කිරීමට හැකියාවක් අප තුල ඇතිකරලීම ය. සරමිප, සැපොල් වැනි රෝගයකට වරක් ගොදුරු වුවහොත් හැඟවා එම රෝගය නොසෙදෙන්නේ යයි අප අතර මතයක් පවතින්නේ ද මේ බැවිනි. සඟහර අවස්ථාවලදී මෙවැනි රෝගයක් සුව වන්නේ බලාපොරොත්තු නොවන ආකාරයේ අතුරු ආබාධ ඉතිරි කරමිනි. ඒ නිසාම, වවැනි සවභාවික ප්‍රතිශක්තිකරණයකින් අප ඇතිකර ගන්නා ප්‍රයෝජනය කෙරෙහි හැමෙ විටකම විශ්වාස තබා ක්‍රියා කල නොහැක.